# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2024.03.20 |
| වේලාව | : | ප.ව.2.30 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| මූලාසනය | : | **එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ මෙනවිය (ප්‍රධාන ලේකම්)** |

<u>සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය</u>

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලොකුවිතාන මහතා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ (බ.ප) |
| 05) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශ (බ.ප) |
| 06) | කේ. චම්පා. එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන අමාත්‍යාංශය ( බ.ප.) |
| 07) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශ (බ.ප) / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්( වැ.බ) (පාලන) |
| 08) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 09) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 10) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 11) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 12) | ජී.එන්.අයි.විමලසේන මිය | - | ජො. සහ. ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.) |
| 13) | නිරූපා මානගේ | - | ජො. සහ. ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය ( බ.ප.) |
| 14) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 15) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරි |
| 16) | නදීෂා ඩී. සපරමාදු මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 17) | ඩී.ජී.නිර්මලා දමයන්ති මිය | - | පරිපාලන නිලධාරි,කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |

**ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2024.03.20 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී සාකච්ඡා කල කරුණු හා එළඹි තීරණ පහත පරිදි වේ.**

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | 2024 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | පළාත් සංවර්ධන සැලැස්මට අයත් පළාත් අමාත්‍යාංශ මට්ටමින් අනුමත කර ඇති ව්‍යාපෘති පිළිබඳ සාරාංශ විස්තරයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ඉදිරිපත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 02 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම සම්බන්ධව | ආණ්ඩුකාරවර කාර්යාලය හා ඉංජිනේරු කාර්යාංශයේ වාහන ලබා ගැනීමට අදාළ ඉල්ලීම් වලින් ඉංජිනේරු කාර්යාංශය සඳහා ලබා ගැනීමට නියමිත වාහන 04 සම්බන්ධ අනුමැතිය අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දී ඇති බව කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ අංක CGC/ASM/PVWP/GENARALහා 2024.03.13 දිනැති ලිපියෙන් දන්වා ඇත.<br><br>මේ අවස්ථාව වන විට විසුරුවා ඇති පළාත් පාලන ආයතන වල ධූරධාරීන් වෙත වෙන් කර තිබූ වාහන සේවා අවශ්‍යතාවය මත තාවකාලිකව පවරා ගැනීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් පළාත් පාලන සහකාර කොමසාරි කාර්යාල 03 මගින් (කොළඹ,ගම්පහ,කළුතර) තොරතුරු කැඳවූ 2024.03.12 දිනැති දැන්වීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මූල්‍ය)<br><br>ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.) |
| 03 | තාවකාලික පදනම මත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් මහතා වෙත පවරා ඇති CAY 1981 රථය පිළිබඳ. | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් මැතිතුමා වෙත තාවකාලික පදනම මත ලබා දී ඇති බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් CAY 1981 රථය, 2022.09.22 දින සිදු වූ අනතුරකින් පසුව දැනට අලුත්වැඩියා කටයුතු සඳහා නියෝජිත ආයතනය භාරයේ පවතින බැවින් හානි හා පාඩු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති අනුව කමිටුවක් පත් කර වගකීම් තීරණය කිරීමටත්,කමිටු නිර්දේශ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමටත් තීරණය විය. | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය ( බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන) |
| 04 | කාර්ය සාධන තරඟාවලිය හා වෙබ් අඩවි තරඟාවලිය. | 2024 වර්ෂයේ කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධයෙන් පළාත් සභා ආයතන දැනුවත් කිරීම සඳහා පාලන චක්‍රලේඛයක් නිකුත් කිරීමට හා නිර්ණායක තීරණය කිරීම සඳහා පියවර ගැනීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | වෙබ් අඩවි යාවත්කාලීන කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ ආයතනවල වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ කටයුතු තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වෙතින්ම පමණක් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ශක්‍යතාවයක් එම අධිකාරියට නොපවතින බව නිරීක්ෂණය වන බැවින් පවත්නා තත්ත්වය සලකා බලා මෙම කාර්යයන් බාහිර ආයතන මඟින් ද කර ගැනීමට හැකි වන අයුරින් පිරිස් හා පුහුණු චක්‍රලේඛ අංක 01/2011 මඟින් ලබා දී ඇති මාර්ගෝපදේශයන් (විධානයන්) සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු) |
| 06 | අනුර බණ්ඩාරණායක රංග ශාලාවේ අයිතිය අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරීම පිළිබඳ. | මෙම රංග ශාලාවේ හිමිකාරිත්වය, පරිපාලනය පිළිබඳ කටයුතු ස්වාධීන කළමනාකරණ මණ්ඩලයක් මඟින් සිදු කිරීමට සුදුසු වන බවට මේ අවස්ථාව වන විට සාකච්ඡාවට බඳුන් වී ඇති බැවින් ඒ සම්බන්ධ ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණ කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය / අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 07 | බස්නාහිර පළාත් සභාව සතු නිල නිවාස හා ඉඩම් තොරතුරු යාවත්කාලීන කිරිම සම්බන්ධව | පළාත් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඒවා ගැසට් කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කර ඇති බැවින් ඒ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් කැඳවන ලද තොරතුරු වාර්තාවට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තවදුරටත් ඉදිරිපත් කලයුතු සංඛ්‍යා දත්ත කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය ( බ.ප.) |
| 08 | ශ්‍රීමත් බාරොන් ජයතිලක විද්‍යාලයේ ගොඩනැගිල්ලේ ගැටළුව | එම ගොඩනැගිල්ල හා භූමිය භුක්තිය පවරා දීම පිළිබඳ කටයුතු කිරීමේ දී මෙම දේපළ පාසල වෙත උපකෘත පාසල් පනත යටතේ ලබා දී ඇති දේපළක් ද යන්න පිළිබඳ තහවුරු කර ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු වන බව තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ( බ.ප.)<br><br>ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශ ( බ.ප.) |
| 09 | නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන කටයුතු සම්බන්ධව | නිවාස සැලසුම් අනුමත කිරිමේදී පළාත් පාලන ආයතනවලට අයත් ඉඩම් මෙගා පොලිස් සැලසුම් යටතේ සංවර්ධිත ඉඩම් ලෙස වෙන්කර ඇති බව හා ඒ අනුව සැලසුම් අනුමැතිය ලබා ගැනිමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යාමට සිදු වීමේ ගැටළුවක් මතුවී ඇති බැවින් මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික ප්‍රදේශ වෙනම හඳුනා ගැනීම් කටයුතු වලින් පසුව බස්නාහිර පළාතේ නාගරික වර්ගීකරණයෙන් වියුක්ත කර හඳුනා ගත හැකි ප්‍රදේශ තේරීම් කටයුතු කරමින් පවතින බැවින් එම කටයුතු අවසන් කිරීමෙන් පසු ප්‍රාදේශීය සභා ප්‍රදේශ ලෙස ගැසට් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී. | ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශ ( බ.ප.) |
| 10 | පළාත් පාලන ආයතන සතු වන නිරවුල් කර ගත යුතු ඉඩම් පිළිබඳ විස්තර. | මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය ( බ.ප.) හා පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය මැදිහත්වීමෙන් හා සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලබන නිරවුල් කර ගතයුතු ඉඩම් පිළිබඳ තොරතුරු රැස් කර පිලියෙල කරන වාර්තාවට අදාළ (කමිටුවක් මගින්) මෙතෙක් තොරතුරු ලබා දී නොමැති කොළඹ මහා නගර සභාව ඉදිරිපත් කලයුතු තොරතුරු ලබා ගෙන එහි අවසන් වාර්තාව ලබා දීමට කටයුතු කරන ලෙසත්,අදාළ තොරතුරු කොළඹ මහා නගර සභාව වෙතින් ලබා ගැනිම කඩිනම් කිරීමටත් තීරණය කරන ලදී. | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය ( බ.ප.)<br><br>ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශ ( බ.ප.) |
| 11 | පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම | මේ වන විට බස්නාහිර පළාත් ගුරු සේවය සඳහා නිලධාරීන් 2320 බඳවා ගැනීමේ කටයුතු අවසන් කර ඇති බැවින් තවදුරටත් පත්වීම ලබා දිය හැකි ප්‍රාථමික පත්වීම් 594 ට අදාළ අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමටත් තීරණය විය. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ( බ.ප.) |

| | | | |
|---|---|---|---|
| 12 | අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම හා 2023 වර්ෂයේ ආයතන වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු | පළාත් සභාවේ තනි ආයතන විසින් 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කල යුතු දිනය 2024.03.16 වේ. එසේම ශාඛා ඇති අමාත්‍යාංශ සහ ආයතන මෙම වාර්තාව 2024.06.20 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතු වන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව තනි ආයතන(උප කාර්යාල හෝ ශාඛා නොමැති) විසින් භාණ්ඩ සමීක්ෂණ අවසන් වාර්තා ලබා දීමේ ප්‍රගතිය Google පොරමයක් මගින් ලබා ගැනීමට තීරණය කරන ලදී.<br>පළාත් පාලන ආයතන වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබා ගැනීම පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බැවින් ඒ පිළිබඳ සොයා බලා පසු විපරම් සිදු කිරීම. | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 13 | පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීම් හා උසස් කිරීම් පිළිබඳ. | සීමිත පදනමින් බඳවා ගැනීම් හා උසස් කිරීම සිදු කිරීම පිළිබඳ ආයතන මට්ටමින් පවත්නා පුරප්පාඩු හා අනෙකුත් විස්තර කැඳවීමක් පිරිස් හා පුහුණු අංශය මගින් සිදුකර ඇති බැවින් මෙතෙක් තොරතුරු ඉදිරිපත් කර නොමැති පළාත් පාලන අමාත්‍යාංශයට ද අදාළ තොරතුරු ආකෘති මඟින් කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් දන්වන ලදී.<br><br>මෙම වර්ෂයේ මුල් කාර්තුවට අදාළ කාර්තු වාර්තා 2024.04.05 දිනට පෙර ඉදිරිපත් කලයුතු වන අතර අදාළ දිනයට පෙර එම වාර්තාව ඉදිරිපත් කිරීමට අපොසත් වුවහොත් පළාත් සභා නිලධාරීන් වෙත වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම නොහැකිවීමේ ගැටලුවකට මුහුණුපෑමට සිදුවිය හැකි බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) සඳහන් කරන ලද බැවින් මේ සම්බන්ධයෙන් ප්‍රමුඛ අවධානය යොමු කර අදාළ දිනයට පෙර කාර්තු වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට තීරණය විය. | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු/මූල්‍ය)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.) |
| 14 | විශ්‍රාම ගොනුවට යොමු කල යුතු නොඉල්ලුම් සහතිකය පිළිබඳ | පළාත් සභාවේ අමාත්‍යාංශ හා ආයතන විසින් ඒ ඒ ආයතන මට්ටමින් පොදු නොවූ නොඉල්ලුම් සහතික ආකෘති භාවිතා කිරීම මගින් විවිධ ගැටලු සහගත තත්ත්වයන් උද්ගතවී ඇති බැවින් බස්නාහිර පළාත් සභාව සඳහා පොදු හා නිවැරදි ආකාරයේ නොඉල්ලුම් සහතිකයක ආකෘතියක් සකස් කිරීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

| | | | |
|---|---|---|---|
| 15 | නිවාඩු දින වැටුප් ගෙවීම පිළිබඳ. | ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන මූලාශ්‍ර කර ගනිමින් පළාත් භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අංක CSO/FIN/3/5/2014-1 හා 2014.04.04 දිනැති අයවැය චක්‍රලේඛ අංක 04/2014 මඟින් ලිත් මාසයේ නිවාඩු දින වැටුප් 02 ක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය අනුවත්, ලිත් මසකට නිවාඩු දින වැටුප් 02 වඩා වැඩ කරන්නේ නම් ප්‍රධාන ලේකම් හෝ ගරු ආණ්ඩුකාරතුමා වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීම අනුවත් සිදු කලයුතු බව දන්වා ඇත.<br><br>එසේ ලිත් මාසයක් සඳහා නිවාඩු දින 02 වඩා වැඩ කරන්නේ නම් ඒ සඳහා වන පූර්ව අනුමැතිය දෙපාර්තමේන්තුව අයත් පළාත් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ලබා දීම වඩා ප්‍රායෝගික හා කාර්යක්ෂම වන බැවින් එම විධි විධාන ඒ අයුරින් සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය ( බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය/පාලන) |
| 16 | 2025 ඇස්තමේන්තු පිළියල කිරීම. | 2024.02.19 දිනැති පළාත් අයවැය චක්‍රලේඛ 01/2024 හි උපදෙස් අනුව එහි සඳහන් කාලසටහනට අනුකූලව (2024.04.05 දිනට පෙර) ලබා දී ඇති උපමාන වලට අනුකූලව 2025 වර්ෂයේ කෙටුම්පත් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය ) විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ( බ.ප.)<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 17 | පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය හා පරිපාලනය. | අංක CSWP/FIN-BD/02/FI/09-2023(B) හා 2024.01.30 දිනැතිව ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශ ( බ.ප.) අමතා යොමු කර 2024 "අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම" යන මැයින් වන ලිපිය මඟින් ලබා දී ඇති මාර්ගෝපදේශ හා උපමාන අනුකූලව කටයුතු කිරීම සඳහා පළාත් පාලන ආයතන මෙහෙයවීමේ වැදගත්කම පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>**01.** 2025 වර්ෂයේ සිට පළාත් සභා ආදායමින් 50% ක් පමණක් පුනරාවර්තන වියදම් සඳහා යොදවාගෙන ඉතිරි ආදායම් ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවීම.<br>**02.** 2024 වර්ෂයේ ජනවාරි 01 දින සිට මහ නගර සභාවල වැටුප් ගෙවීම සඳහා 80% ක මූල්‍යනයක් පමණක් ලබා දීම.<br>**03.** 2025 වර්ෂයේ සිට පළාත් පාලන ආයතන වැටුප් ප්‍රතිපූරණ ක්‍රමානුකූල ව අඩු කර ඉදිරි වර්ෂ 05 තුළ පළාත් පාලන ආයතනයන් ස්වයං මූල්‍යකරණයකට ක්‍රමානුකූල ව යොමු කිරීම. | ලේකම්,<br>පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය) |

| | | | |
|---|---|---|---|
| 18 | පළාත් භාණ්ඩාගාරයෙන් පැහැදිලි කිරීම් හා උපදෙස් ලබා ගැනීම. | පළාත් අමාත්‍යාංශ හා ආයතන වල මූල්‍ය පරිපාලන කටයුතු වලදී පළාත් භාණ්ඩාගාරයේ උපදෙස් හා පැහැදිළි කර ගැනීම් ලබා ගැනීමේ දී ලිඛිත ලබා ගැනීමත්, දුරකථන මාර්ගයෙන් වාචික ව පැහැදිළි කිරීම් හා උපදෙස් ලබා ගත්තේ නම් ඒවා පිළිබඳ ලිඛිත තහවුරු වහාම ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ( බ.ප.) |
| 19 | රා.ප.ච. 14/2022,14/2022(I,II, III) අනුව වැටුප් රහිත නිවාඩු ලබා විදේශ ගත වූ නිලධාරීන් මෙරටට එවිය යුතු ප්‍රේෂණ පිළිබඳ. | බස්නාහිර පළාතට අදාළ කර ගෙන ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022,14/2022(I), 14/2022(II),14/2022(III) "ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ" චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිලධාරීන් විසින් විදේශ ව්‍යවහාර මුදලින්(ඩොලර්) මෙරටට ප්‍රේෂණය කල යුතු මුදල් විධිමත් අයුරින් ප්‍රේෂණ කටයුතු සිදු කෙරෙන්නේ ද යන්න පිළිබඳ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මට්ටමින් පසු විපරම් කිරීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 20 | පළාත් සභා සංකීර්ණයේ ආපනශාලාවේ පරිපාලනය | බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ 1 වන මහලේ ස්ථාපිත කර ඇති ආපනශාලාව "පවත්වාගෙන යාම" 2018.06.19 දින පැවති පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය අංක VI/124/06-2018-01(i) මගින් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය වෙත පවරා ඇත.<br>වර්තමානය වන විට ආපනශාලාවේ කටයුතු හා එහි වර්තමාන ක්‍රියාදාමයන් පිළිබඳ සොයා බලා එහි කටයුතු වඩා විධිමත් කිරීම සඳහා කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගැනීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන)<br><br>ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.) |

වාර්තා කලේ : නදීෂා ඩී.සපරමාදු
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

.........................................

එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දිනය: 2024.03. 28